# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1368/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 31/10/2023<br>පැය 2135 |

## මාධ්‍ය නිවේදනය

**ඇල්ල ප්‍රදේශයේ හෝටලයක් ඉලක්ක කර වෙඩි තැබීමක් - ඇල්ල පොලිස් වසම.**

2023.10.31 වන දින රාත්‍රී කාලයේදී ඇල්ල පොලිස් වසමේ ඇල්ල වැල්ලවාය මාර්ගයේ රාවණාඇල්ල ප්‍රදේශයේ පිහිටි හෝටලයක් ඉදිරිපිට වෙඩි තැබීමක් සිදුව ඇති බවට ඇල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් හෝටලය දෙසට ටී 56 ගිනි අවියකින් වෙඩි තැබීමක් සිදුකර ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වන අතර, වෙඩි තැබීම සිදුවන අවස්ථාවේ හෝටලය ඉදිරිපිට රැඳී සිටි පුද්ගලයෙකු වෙඩි වැදීමෙන් සුළු තුවාල ලබා දෙමෝදර රෝහලට ඇතුලත් කර ඇත.

මෙම වෙඩි තැබීම හෝටලය ඉලක්ක කර සිදුකළ වෙඩිතැබීමක් බවට සී.සී.ටී.වී දර්ශන පරීක්ෂා කිරීමේදී අනාවරණය වන අතර වෙඩි තැබීම සිදුකළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඇල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**